# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,270 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 402 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 මාර්තු මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

399 - B 82321 — 5,413 (2022/03)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දූරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීමේ විවෘත තරග විභාගය - 2022

### Open competitive Examination for the enrolment of students for the Higher National Diploma in Agricultural Production Technology in Sri Lanka - Schools of Agriculture - 2022

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලයන් හි පැවැත්වෙන ''කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ - 6)'' හැදෑරීම සඳහා 2021/2023 අධ්‍යයන වර්ෂයට අදාළව සිසුන් ඇතුළත් කර ගැනීමේ තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් 2022 මැයි මාසය තුළදී සිංහල හා දෙමළ මාධ්‍යය වලින් ප්‍රධාන නගර කීහිපයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පැවැත්වීමට අපේක්ෂිතය.

02. *කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව* :

2.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි කර ඇති පාඨමාලාවක් වන අතර ඒ සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටම (6) ලබාදේ.

2.2 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අඟුණකොළ- පැලැස්ස, කරපිංච, කුණ්ඩසාලේ, පැල්වෙහෙර සහ වව්නියාව යන කෘෂිකර්ම විද්‍යාලයන් තුළ කාන්තා සහ පිරිමි දෙපාර්ශ්වයට ම විවෘත පාඨමාලාවක් ලෙසින් මෙම පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.

2.3 පාඨමාලා කාලය වසර 2 1/2 කි. එයින් වසර 2ක් කෘෂිකර්ම විද්‍යාලයක් තුළදී නිශ්චිත විෂය මාලාවකට අනුකූලව පුහුණුව ලබාදේ. අනතුරුව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) අධීක්ෂණය යටතේ මාස 06ක රැකියාස්ථ පුහුණුවක් නම් කරන ලද ආයතනයකින් ලබා ගත යුතුවේ.

2.4 පූර්ණකාලීන නේවාසික පාඨමාලාවක් වන මෙම පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

2.5 ඇතුළත් කරගැනීමේ තරග විභාගයේ ප්‍රතිඵල මත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූවන්ගේ සුදුසුකම්වල නිරවද්‍යතාවය සම්මුඛ පරීක්ෂණයක් තුළින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීම සඳහා තෝරාගනු ලැබේ.

03. *පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්* :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් (06) සමත් වී තිබිය යුතු අතර සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයන් තුන සහ තවත් එක් විෂයයකට සම්මාන හෝ ඊට ඉහළ සාමාර්ථයන් තිබිය යුතුය.

ඉහත වාර දෙක තුළ දී හෝ වෙනත් ඕනෑම වාර ගණනකට මුහුණ දී හෝ ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු වේ.

සහ

අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී ජීව විද්‍යාව විෂය ධාරාව තුළ ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව/කෘෂි විද්‍යාව යන විෂයයන් හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ 03ක් එකවර ලබා තිබීම.

හෝ

අ.පො.ස. (උ.පෙ.) විභාගයේ දී තාක්ෂණවේදය විෂය ධාරාවේ ජෛව පද්ධති තාක්ෂණවේදය/ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් හදරා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ තුනක් එකවර ලබා තිබීම.

**වැදගත්** : ජීව විද්‍යාව සහ තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා උක්ත විෂයය සංකලනවලට අදළ විෂයන් තුනෙන් බැහැර වෙනත් විෂයයන් හදරා තිබීම නුසුදුසුකමක් ලෙස සැලකේ.

3.2 **2022.04.04** දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර අවුරුදු 27ට නොවැඩි විය යුතුය. (ඒ අනුව අයදුම්කරුගේ උපන් දිනය 2005.04.04 දින හෝ ඊට පෙර හා 1995.04.04 දින හෝ ඊට පසු විය යුතුය.)

3.3 මෙම පාඨමාලාව තුළ කෘෂිකාර්මික කටයුතුවලට අදල ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුළත් හෙයින් පාඨමාලා හැදෑරීම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයක් පැවතිය යුතුය. පාඨමාලාවට ඇතුල්වන අවස්ථාවේ දී ගර්භණීභාවයේ පසුවීම පාඨමාලාවට ඇතුළත් කර නොගැනීමටත්, පාඨමාලාවට

ඇතුළත් වීමෙන් අනතුරුව ගර්භණී තත්වයට පත්වීම පාඨමාලාවෙන් ඉවත් කිරීමටත් හේතුවක් වනු ඇත.

(පාඨමාලාව හැදෑරීම සඳහා ඔබ තෝරාගතහොත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බවට රජයේ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කල යුතුය.)

3.4 පුජ්‍ය පක්ෂය මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

3.5 රජයේ සේවයේ නියුතු අය මෙම තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

04. *විභාගය පැවැත්වෙන මාධ්‍යය සහ විභාග මධ්‍යස්ථාන* :

4.1 කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවලට සිසුන් ඇතුළත් කරගැනීමේ තරග විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලබන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

4.2 තරග විභාගය පහත සඳහන් නගර ආශ්‍රිතව පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී 2022 මැයි මාසය තුළ දී පවත්වනු ලැබේ. අයදුම්පත පිරවීමේ දී තමා විභාගයට පෙනී සිටීමට කැමති නගරය සහ ඊට අදළ අංකය නියමිත ස්ථානයේ ඇතුළත් කළ යුතුය. එම තෝරාගැනීම පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1 | අම්පාර |
| 2 | අනුරාධපුරය |
| 3 | දඹුල්ල |
| 4 | ගම්පහ |
| 5 | ගාල්ල |
| 6 | හම්බන්තොට |
| 7 | මහනුවර |
| 8 | කුරුණෑගල |
| 9 | වවුනියාව |

4.3 කිසියම් නගරයක පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉල්ලුම්කර නොමැති විට හෝ වෙනත් ප්‍රායෝගික අපහසුතාවයන් ඇති වූ විට අයදුම්කරුවන් විසින් ඉල්ලුම්කර ඇති විභාග මධ්‍යස්ථානය වෙනුවට වෙනත් මධ්‍යස්ථානයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ඇත.

5. *අයදුම්පත් කැඳවීම* :

5.1 මෙම තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ සිදු කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ www.doa.gov.lk යන වෙබ් අඩවිය හරහා මේ සඳහා අයදුම් කල යුතුය.

5.2 අයදුම්කරු අ.පො.ස. (සා.පෙ.) විභාගයට පළමුවරට පෙනී සිටි දිස්ත්‍රික්කය ඔහු/ඇය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකන බැවින්, අයදුම්පත පිරවීමේදී තමා අ.පො.ස. (සා.පෙ) විභාගය සඳහා පළමුවරට පෙනී සිටි දිස්ත්‍රික්කය ඊට අදළ ස්ථානයේ ද සඳහන් කල යුතුය.

5.3 විභාග ගාස්තුව රු. 750 කි. මහජන බැංකුවේ පේරාදෙණිය ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට විභාග ගාස්තු බැරකර අයදුම්කරුගේ නමින් ලදුපතක් ලබා ගත යුතුය. එම මුදල් කුවිතාන්සිය නිකුත්කල දිනය, ශාඛාව හා අංකය අයදුම්පතේ සඳහන් කල යුතුය.

5.4 අයදුම්පත ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සම්පූර්ණ කල යුතු වේ.

5.5 විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.

5.6 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2022.04.04** දිනෙන් පසුව අයදුම්පත වෙබ් අඩවියෙන් ඉවත් කරනු ලැබේ.

5.7 මාර්ගගත ආකාරයෙන් සම්පූර්ණ කල අයදුම්පතේ දෘඩ පිටපතක් ලබාගැනීම අනිවාර්ය වේ.

5.8 එසේ ලබාගත් දෘඩ පිටපත පහත සඳහන් ඇමුණුම් සහිතව ලියාපදිංචි තැපෑලෙන් පමණක් **2022.04.07** වැනි දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (NVQ-6)'' යන්න සඳහන් කළ යුතුය.

ඇමුණුම :

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල ලේඛනවල ඡායා පිටපත්,
(ii) අ.පො.ස. (උ.පෙ.) විභාගයේ ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපත,
(iii) මුදල් ගෙවූ කුවිතාන්සියේ මුල් පිටපත.

නියමිත දිනට පසුව ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැති වන හෝ

අයදුම්පත් පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

5.9 ඇමුණුම් ද සහිත අයදුම්පතෙහි දෘඪ පිටපත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති වීම විභාගය සඳහා පෙනී සිටීමට නුසුදුසුකමක් වේ. එබැවින් නියමිත දිනට හෝ ඊට පෙර එම ලේඛන එවීමට වග බලා ගත යුතු වේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පතේ සහ විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපත් තමා සතුව තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. අනන්‍යතාවය සනාථ කිරීම :

6.1 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර හෝ ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු වේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය.

07. කොවිඩ් - 19 අසාදනය වැළැක්වීමේ ක්‍රියාමාර්ග :

7.1 විභාග මධ්‍යස්ථානයට ඇතුල්වීමේ සිට විභාගය අවසන්ව නික්ම යනතුරු කොවිඩ් 19 වැළැක්වීමේ මාර්ගෝපදේශයන්ට යටත්ව ක්‍රියා කළ යුතු වේ.

08. විභාග ක්‍රමය :

8.1 තරග විභාගය සඳහා කෘෂිකර්මය සහ බුද්ධි පරීක්ෂණය ලෙස පැය 01 බැගින් වූ විෂයයන් දෙකක් ඇතුළත්ය. සෑම විෂයයක් සඳහාම ලකුණු 100 බැගින් ලබාදී අවසන් ලකුණු ප්‍රමාණය මුළු ලකුණු 200න් කොපමණ ද වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ.

8.2 එක් එක් විෂයය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය 30% ක් වේ.

8.3 විෂය නිර්දේශය :

කෘෂිකර්මය : අ.පො.ස. (උ.පෙළ) කෘෂිකර්ම විෂය නිර්දේශය මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ යාවත්කාලීන විෂය කරුණු ආශ්‍රිතව සකස් කරන ලද බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගුවේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

බුද්ධි පරීක්ෂණය : රටා, සබඳතා, පුරෝකථන, ගැළපීම්, විශ්ලේෂණ, කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

8.4 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා, ඇමුණුම් ද සහිත අයදුම්පත්‍රයේ දෘඪ පිටපත යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. ඒ බව කෙටි පණිවිඩයක් මගින් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය විසින් දැනුම් දෙනු ඇත. ප්‍රවේශ පත්‍රය සම්බන්ධ යම් ගැටළුවක් වෙතොත් අදළ තොරතුරු ද සමඟින් 0812 388 085 හෝ 0812 388 059 යන දුරකථන අංක වලින් විමසීමක් කළ හැක.

8.5 අයදුම්පතේ සඳහන් කර ඇති අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ග වන විද්‍යුත් තැපැල් ලිපිනය, whatsapp අංකය හා දුරකථන අංක බඳවා ගැනීමේ කටයුතු අවසන් වනතුරු නොවෙනස්ව පවත්වාගත යුතුය. එම අංක වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

8.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. අයදුම්කරුවන් තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, මාණ්ඩලික සේවයේ නිළධාරියෙකු, ත්‍රිවිධ හමුදා අධිකාරිය ලත් නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කර ගත යුතුය.

8.7 විභාගය සඳහා පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

8.8 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කලහොත් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට අපේක්ෂකයන් හට සිදුවේ.

8.9 තරග විභාගයේදී සිසුන් ලබාගත් ලකුණු දිස්ත්‍රික්ක මට්ටමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරනු ලැබේ. එම ලකුණු පාදක කර ගනිමින් සහ බඳවාගනු ලබන සංඛ්‍යාව පිළිබඳව සැළකිලිමත් වෙමින් වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් දිස්ත්‍රික්ක පදනමින් තෝරාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහිදී අධ්‍යාපනික හා අදාළ අනිකුත් සහතික පරීක්ෂා කිරීම සිදුකරන අතර සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබාදෙනු නොලැබේ. කෘෂිකර්ම විද්‍යාලවලට ඇතුළත් කර ගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට වඩා

වැඩි සිසුන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

8.10 ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවකදී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

8.11 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අයදුම්කරුවන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

09. බඳවා ගැනීමේ ක්‍රමවේදය :

9.1 අදාළ වර්ෂය තුළ දී සියලුම කෘෂිකර්ම විද්‍යාලවලට බඳවා ගැනීමට අපේක්ෂිත මුළු ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගෙන එක් එක් දිස්ත්‍රික්කවලින් ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කරනු ලැබේ.

9.2 දිස්ත්‍රික් පදනම සලකා බැලීමේදී අ.පො.ස. (සා.පෙ.) විභාගයට පළමුවර පෙනී සිටි දිස්ත්‍රික්කය අයදුම්කරු හෝ අයදුම්කාරිය අයත් දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ.

9.3 අදාළ වර්ෂයේදී එක් එක් කෘෂිකර්ම විද්‍යාලයට ඇතුළත් කරගනු ලබන පිරිමි හා කාන්තා සිසුන් සංඛ්‍යාව තීරණය කරනුයේ එම විද්‍යාලවල පිරිමි හා කාන්තා නේවාසිකාගාරවල ඇති ධාරිතාවය සහ එම විද්‍යාලවල ඇති පුහුණු පහසුකම් පාදක කර ගනිමිනි. එබැවින් තෝරා ගැනීමට සලකා බලන තරග විභාගයේ කඩඉම් ලකුණු මට්ටම දිස්ත්‍රික්කයේ පිරිමි හා කාන්තා අයදුම්කරුවන් අතර වෙනස් විය හැක.

9.4 කෘෂිකර්ම විද්‍යාලවලට උපරිම සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමේ අරමුණින් කිසියම් දිස්ත්‍රික්කයක තෝරා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති විටදී අනිකුත් දිස්ත්‍රික්ක වලින් අවශ්‍ය සිසුන් සංඛ්‍යාව ඔවුන් ලබා ඇති තරග විභාග ලකුණු පදනම් කර ගනිමින් තෝරාගනු ලැබේ.

10. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ආචාර්ය එස්. එච්. එස්. ඒ. ද සිල්වා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2022 පෙබරවාරි මස 21 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

03-21

---

## 2022.02.03 දිනැති ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2022.02.03 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2266 දරන *ගැසට් පත්‍රයේ* පළකල කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලවලට 2022 වසර සඳහා සිසුන් ඇතුළත් කරගැනීම සඳහා වූ *ගැසට්* නිවේදනයට පහත සඳහන් සංශෝධනයන් සිදු කෙරේ. :

එස්. සී. ජගත්,
අධ්‍යක්ෂ ජනරාල්.

සංශෝධන :

01. පොදු කොන්දේසි යටතේ අංක 12 වගන්තිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පවත්වනු ලබන පොදු විභාගයේ ගාස්තුව රු. 500 ලෙස සංශෝධනය කෙරේ.

02. ඇතුළත්වීමේ සුදුසුකම් සංශෝධනය

(අ) ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5/6 (NVQ 5/6) පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවන්ට ඇතුළත් වීමේදී NVQ 3/4 සුදුසුකම සමග එක් වසරක පළපුරුද්ද ඉල්ලා ඇති පාඨමාලාවල එක් වසරක පළපුරුද්ද ඉවත් කෙරේ. ඒ අනුව NVQ 3/4 සුදුසුකමෙන් ඇතුළත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් හට පළපුරුද්ද අවශ්‍ය නොවේ.

03. සෑම පාඨමාලාවක් සඳහාම බඳවා ගැනීමේ වයස 2022.01.01 දිනට වයස අවු. 17ට වැඩි විය යුතුය.

04. සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍ය *ගැසට්* නිවේදන අතර වෙනසක් ඇතොත් සිංහල *ගැසට්* නිවේදනය බලාත්මක වේ.

05. බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස NVQ 3/4 සුදුසුකම් සළකා බැලීමේදී NVQ 4 සුදුසුකම් ලබා ඇති සිසුන් සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙනු ලැබේ.

06. දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා සඳහා ඇතුළත් වීමේ සුදුසුකමක් වන අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් නොව සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

07. කාර්යාල කළමනාකරණ ක්ෂේත්‍රයට BCS 06 යටතේ ලේකම් පරිචය පිළිබඳ ජාතික සහතිකය පාඨමාලාව අනු අංක 72A ලෙස අලුතින් ඇතුළත් කෙරේ.

| *අනු අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍ය/ NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල/කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 72 A | BSC 06 | ලේකම් පරිචය පිළිබඳ ජාතික සහතිකය<br>පූර්ණ කාලීන<br>දිවා මාස 18<br>(කර්මාන්තගත පුහුණුව මාස 06 ඇතුළත්වේ.) | 1. දෙවරකට නොවැඩි වාර ගණනකදී මාධ්‍ය භාෂාව හා ගණිතය ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.<br>i. අයදුම්කරුවන්ගේ ඉංග්‍රීසි භාෂාමය ප්‍රවීණතාවය (කථා කිරීම, ලිවීම) කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.<br>ii. අවශ්‍යතාවය මත ඉංග්‍රීසි භාෂාමය ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.<br>2. 2022.01.01 දිනට වයස අවු. 17ට වැඩි විය යුතුය. | *ඉංග්‍රීසි මාධ්‍ය*<br>*NVQ මට්ටම් 4*<br>යාපනය, බදුල්ල, ගාල්ල, මහනුවර, මරදාන, මඩකලපුව, ගම්පහ, හෝමාගම, කලුතර, කෑගල්ල, කුළියාපිටිය, මාතලේ, සම්මන්තුරය, බලපිටිය |

08. පහත සඳහන් කේත අංකවලින් දැක්වෙන අර්ධකාලීන පාඨමාලා සඳහා දක්වා ඇති ඇතුළත්වීමේ සුදුසුකම්වලට අමතරව පහත සඳහන් සුදුසුකම් ද ඇතුළත් කෙරේ. :

| *අනු අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *අමතර ඇතුළත්වීමේ සුදුසුකම්* |
|---|---|---|---|
| 95 | ETC 01.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - සිවිල් ඉංජිනේරු) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් භාෂා මාධ්‍ය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි), ගණිතය, විද්‍යාව සහ වෙනත් විෂයන් තුනක් ඇතුලුව විෂයයන් 6 කින් සමත්ව තිබීම, සහ මෙම |

| අනු අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | අමතර ඇතුළත්වීමේ සුදුසුකම් |
|---|---|---|---|
| 83<br>101 | ETC 02.1<br>ETC 04.1 | විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ජාතික තාක්ෂණ සහතිකය - විදුලි හා විද්‍යුත් ඉංජිනේරු (NCT electrical and electronic) | සුදුසුකම් මත බඳවාගනු ලබන සිසුන් පාඨමාලාවේ දෙවන වසර අවසන් වීමට පෙර අදාළ විෂයය ක්ෂේත්‍රයෙන් NVQ 4 සුදුසුකම් ලබාගැනීම අනිවාර්ය වේ. |
| 104 | ETC 08.1 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - ප්‍රමාණ සමීක්ෂණ) | |
| 105 | ETC 09.1 | නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය (NCT) - යාන්ත්‍රික ඉංජිනේරු - නිෂ්පාදන තාක්ෂණය)<br><br>මෝටර් රථ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - යාන්ත්‍රික ඉංජිනේරු ( NCT mechanical Automobile) | |

09. අනෙකුත් සංශෝධන :

| අනු අංකය | පාඨමාලා කේතය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 06 | A 01S018 | මෙම පාඨමාලාවේ නම ශාක පටක රෝපණ පර්යේෂණාගාර සහකාර ලෙස වෙනස් කෙරේ. |
| 23 | F 45S004 | ලී වැඩ කාර්මික (ගොඩනැගිලි) පාඨමාලාව NVQ 3 මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලයද ඇතුළත් විය යුතුය. |
| 34 | F 45S006 (ECC 78) | ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් සඳහා වූ ජාතික සහතිකය පාඨමාලාවේ කාලය පූර්ණකාල දිවා මාස 18 (කර්මාන්තගත පුහුණුව මාස 6ක් ඇතුලත්ව) ලෙස සංශෝධනය කෙරේ. මෙහි පාඨමාලා කේතය ECC 78 ලෙස වෙනස් කෙරේ. |
| 47 | ECC 08 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (ඉලෙක්ට්‍රොනික්) පාඨමාලාව NVQ මට්ටම් 4 පැවැත්වෙන ස්ථානයක් ලෙස මරදාන තාක්ෂණ විද්‍යාලය ද ඇතුළත් විය යුතුය. |
| 49 | E40S001 | විදුලි කාර්මික ශිල්පී පාඨමාලාවේ NVQ 3 මට්ටම සඳහා ඇතුළත්වීමේ සුදුසුකම 09 ශ්‍රේණිය සමත් වී තිබීම ලෙස හා NVQ 4 මට්ටම් සඳහා ඇතුළත්වීමේ සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සමත්ව තිබීම ලෙස සංශෝධනය කෙරේ. |
| 53 | I-64S001 | විදුලි සංදේශ කාර්මික ශිල්පී පාඨමාලාවේ කර්මාන්තගත පුහුණුව මාස 12 ලෙස සංශෝධනය කෙරේ. |
| 62 | ECC 26 | කළුතර කාර්මික විද්‍යාලයේ පැවැත්වෙන යන්ත්‍රණය පිළිබඳ සහතික පාඨමාලාවේ NVQ මට්ටම් 3 වෙනුවට NVQ මට්ටම් 4 ලෙස සංශෝධනය විය යුතුය. |
| 75 | D29S002 | ශීතකරණ හෝ වායුසමන ශිල්පී පාඨමාලාව NVQ 3 මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය ද ඇතුළත් විය යුතුය. |
| 83 | ETC 02.1 | විදුලි තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ඇතුළත්වීමේ සුදුසුකම්.<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් විෂයයන් 03කින් එකවර සමත් වීම (GIT සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර) ලෙස සංශෝධනය විය යුතුය. |

| අනු අංකය | පාඨමාලා කේතය | සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|
| 86 | ETB 29 | වායු හා ද්‍රව පීඩන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාවේ පාඨමාලාවේ ඇතුළත්වීමේ සුදුසුකම පහත ලෙස සංශෝධනය විය යුතුය. :<br><br>1. අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම. (මෙහිදී අදාළ ක්ෂේත්‍රයේ, වසරකට නොඅඩු පාඨමාලාවක් හදරා NVQ මට්ටම් 4 ලබා ඇති සිසුන් හට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.)<br>හෝ<br>අ.පො.ස.(උ.පෙළ) ඉංජිනේරු තාක්ෂණවේදය/ගණිතය/විද්‍යාව යන විෂයධාරාවන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සමත් වී තිබීම. (GIT සහ සාමාන්‍ය ඉංග්‍රීසි හැර)<br>හෝ<br>අ.පො.ස. (උ.පෙළ) කලා විෂය ධාරාවේ දෘඪ තාක්ෂණය (Hard Technology) යටතේ වූ විදුලි තාක්ෂණය (Electrical Technology), විද්‍යුත් තාක්ෂණය (Electronic Technology), යාන්ත්‍රික තාක්ෂණය (Mechanical Technology) තොරතුරු තාක්ෂණය (ICT) යන විෂයන් අතුරින් එක් විෂයක් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විෂයන් තුනක් සමත් වී තිබීම.<br><br>2. 2022.01.01 දිනට වයස අවු. 17 නොඅඩු විය යුතුය. |
| 95 | ETC 01.1 | ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (ජාතික තාක්ෂණ සහතිකය - (සිවිල් ඉංජිනේරු)) පාඨමාලාව මට්ටම පැවැත්වෙන ස්ථානයක් ලෙස බලපිටිය කාර්මික විද්‍යාලයද ඇතුළත් විය යුතුය. |
| 111 | ETB 11 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව බඳවා ගැනීමේ සුදුසුකම අදාළ ක්ෂේත්‍රයේ NVQ මට්ටම් 3 හෝ 4 සහතික ලබා තිබීම ලෙස සංශෝධනය කෙරේ. අනෙකුත් බඳවා ගැනීමේ සුදුසුකම් නොවෙනස්ව පවතී. |
| 121 | ETA 22 | සමුද්‍රීය හා සැපයුම් කළමණාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව පාඨමාලාව NVQ මට්ටම් 5/6 ඒකාබද්ධ ලෙස හා පාඨමාලා කාලය අවුරුදු 2 ½/දිවා/පූර්ණ කාලීන ලෙස සංශෝධනය කෙරේ. (කර්මාන්තගත පුහුණුව මාස 06 ද ඇතුළත්ය) |

03-22

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| මාර්තු | 2022.03.04 | සිකුරාදා | 2022.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.11 | සිකුරාදා | 2022.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.18 | සිකුරාදා | 2022.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.03.25 | සිකුරාදා | 2022.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2022.04.01 | සිකුරාදා | 2022.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.08 | සිකුරාදා | 2022.03.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.12 | අඟහරුවාදා | 2022.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.22 | සිකුරාදා | 2022.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.04.29 | සිකුරාදා | 2022.04.12 | අඟහරුවාදා | දහවල් | 12.00 |
| මැයි | 2022.05.06 | සිකුරාදා | 2022.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.13 | සිකුරාදා | 2022.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.20 | සිකුරාදා | 2022.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.05.27 | සිකුරාදා | 2022.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.